# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 3 ශ්‍රේණිය - පරිසරය (ඔක්තෝබර්-2 සතිය)

## 13 තේමාව - පොළොව හා අහස

- ❖ දුවේ පුතේ පහතින් දී ඇති ද්‍රව්‍ය සපයා ගන්න.

  (වියළි ශාක පත්‍ර, කුඩාවට ඉරා ගත් කඩදාසි කෑලි, පුළුන් කැබලි තිබේනම් හොරබීජ, අගුණමල්, මොණරකුඩුම්බිය, වියළි මල්, දල්වන ලද හඳුන්කූරක්)

  - ඉහත සපයාගත් දේවල් සුළඟ හමන දිශාවට විසි කර බලන්න.
  - සුවඳ කූරෙන් පිටවන දුම් ගමන් කරන දිශාව බලන්න.
  - සුළං හමන විට ගස්වල කොළ සෙළවෙන ආකාරය බලන්න.
  - තෙත් රෙදි කෑල්ලක් සුළං ඇති වෙලාවක වැලක දමා සිදුවන දේ රෙදි කෑල්ල අතගා බලන්න.

  මෙහෙම දේවල් සිදුවන්නේ ඇයි කියලා දුවලා, පුතාලා දන්නවද? සුළඟ නිසා, සුළඟේ වේගය අඩු වැඩි වන නිසා.

- ❖ දුවේ පුතේ, සෙ.මී. 30ක් දිග සෙ.මී. 15 පළල රෙදි කැබැල්ලකින් කොඩියක් මසා ගන්න. එය කෝටුවකට ගසා ගන්න. එය අතට ගෙන සුළං හමන දිශාවටත් ප්‍රතිවිරුද්ධ දිශාවටත් ගමන් කරන්න. ඔබේ අතට, ඇඟට දැනුණ දේ ලියන්න
- ❖ වැඩිහිටියකු ලවා කොඩිය උස ස්ථානයක රඳවා ගන්න.
- ❖ සුළඟට කොඩිය චලනය වෙන විදිහ චිත්‍රයට නඟන්න.

- මල්ලියි මමයි අකුරට යන වෙලාවේ

  කළුකරගෙන ආවා වැහි වලාවේ

  මුවාවෙන්න ගසකුත් නැති වෙලාවේ

  පමා වෙලා වැහැපන් වැහි වලාවේ.

- පුතුනේ මේ අහගන්න පුතුනේ

  පුතුනේ මේ අහගන්න................

- ❖ සුළඟින් ක්‍රියාත්මක වෙන සුළං පෙත්තක් කඩදාසියකින් හදන්න.